ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2023

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
අංක 44 (බී 90), ආර්.ජී. සේනානායක මාවත
කොළඹ 07.

2023-07- ০6

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ප්‍රධානීන්

**ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 156 ආ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා විසින් 2023.05.04 දින සිට ක්‍රියාත්මක වනසේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවා ඇත.

02. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සංයුතිය පහත පරිදි වේ.

1. ඩබ්. සුධර්මා කරුණාරත්න මිය - සභාපති
2. ඩබ්. අයිවන් තිසේරා මහතා - සාමාජික
3. ඩී.ජේ. පී. දරණගම මහතා - සාමාජික
4. සුමන්දිරන් සින්නකන්ඩු මහතා - සාමාජික
5. ජේ.ජී. පුබුදු අසංග ගුණවංශ මහතා - සාමාජික

මෙම කොමිෂන් සභාවේ මහලේකම් වශයෙන් ඩී.සී. සිරිබද්දන මහතා කටයුතු කරයි.

03. කොමිෂන් සභා කාර්යාලය අංක 44 (බී 90), ආර්.ජී. සේනානායක මාවත, කොළඹ 07 ස්ථානයේ ස්ථාපිත කර ඇති අතර කොමිෂන් සභාවේ දුරකථන හා ෆැක්ස් අංක පහත පරිදි වේ.

දුරකතන අංකය (පොදු) - 011-2665152
ෆැක්ස් අංකය - 011-2665162

04. කොමිෂන් සභාවේ කර්තව්‍ය, විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 156 ඇ (1) ව්‍යවස්ථාව යටතේ පැහැදිලි කර ඇති අතර, ඒ අනුව, ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම මෙන්ම සියළුම රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරණු ලැබීම සම්බන්ධයෙන් පරිපාටි හා උපමාන සකස් කිරීම, නියාමනය සහ අධීක්ෂණ කටයුතු මෙම කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඒ අනුව, අවශ්‍ය උපමාන හා උපදේශ ඉදිරියේදී නිකුත් කිරීමට නියමිතව ඇති අතර, එතෙක්, දැනට භාවිතා කරණු ලබන පහත සඳහන් මාර්ගෝපදේශ, උපමාන හා උපදේශ සහ ඒ ආශ්‍රිත අතිරේක, චක්‍රලේඛ, උපදෙස් හා අදාළ අනෙකුත් විධිවිධාන එලෙසම ක්‍රියාත්මක විය යුතුය. එබැවින්, ඒ අනුව කටයුතු කරන මෙන් දන්වමි.

i. Procurement Guideline and Manual (Goods and Works) - 2006
ii. Guidelines for Selection and Employment of Consultants - 2007
iii. Consulting Services Manual - 2007
iv. Guidelines for Procurement of Pharmaceuticals & Medical Devices of a Consumable Nature - 2022
v. PPP Guidelines for Private Sector Infrastructure Projects - 1998
vi. Guide to Project Management & Contract Management - 2017

05. මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් එම දෙපාර්තමේන්තුව මඟින්ම සිදුකරනු ඇත. එසේම, රාජ්‍ය ප්‍රසම්පාදන සම්බන්ධව ඇති අභියාචනා ක්‍රමවේදයද දැනට ක්‍රියාත්මක වන ආකාරයටම තවදුරටත් ක්‍රියාත්මක වේ.

06. මේ සම්බන්ධව තවදුරටත් පැහැදිලි කරගැනීම් අවශ්‍ය වන්නේ නම් අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති), ඒ.ඩී.පී.අයි. ප්‍රසන්න මහතා, දුරකතන අංක 011-2665157 හෝ 011-2665152 මඟින් අමතන මෙන් දන්වා සිටිමි.

07. ඔබ යටතේ ඇති සියළුම ආයතන ප්‍රධානීන් මෙම චක්‍රලේඛය පිළිබඳව දැනුවත් කරන ලෙස තවදුරටත් දන්වමි.

සුධර්මා කරුණාරත්න
සභාපති
ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
5. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
6. විගණකාධිපති